චක්‍රලේඛ අංක: 1993/09.

මගේ අංකය: 4/ ගුරුආ/ 6මහ/ 44/ විවිධ
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
ශ්‍රී ජයවර්ධනපුර,
බත්තරමුල්ල.

1993.05.20 දින

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සහ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

## රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාවන් හා නිවාඩු

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ රා. පරි. ච. ලේ. අංක: 03/92 හි දෙවන ඡේදයේ අංක: III කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව රාජ්‍ය නිලධාරිනියන්ට ගර්භනී අවස්ථාව මාස 05 ක් වූ පසු රාජකාරී සඳහා සේවා ස්ථානයට පැය භාගයක් ප්‍රමාද වී පැමිණීමට ද සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පැය භාගයකට ප්‍රථම පිට වී යාමටද අනුමැතිය දී ඇත.

03. මෙම වරප්‍රසාදය ඉහත චක්‍රලේඛ ලිපියේ සඳහන් පරිදි ගුරු මහත්මීන්හට ද ලබාදීම අනුමත කරමි.

04. පාසලේ ඉගැන්වීම් කටයුතුවලට බාධාවක් නොවන පරිදි මේ පිළිබඳව සුදුසු වැඩ පිළිවෙලක් යොදා ගැනීමට සියලුම කොට්ඨාස අධ්‍යාපන කාර්යාල භාර නිලධාරීන් වෙත උපදෙස් දෙන්න.

එම්. ඩී. ඩී. පීරිස්
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත :

01. සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්.

ච/12.